WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**47 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)**
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

| | |
|---|---|
| සිංහල සාහිත්‍ය රසාස්වාදය | I, II |
| இலக்கிய நயம் சிங்களம் | I, II |
| Appreciation of Sinhala Literary Texts | I, II |

## සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

※ **පළමුවන** ප්‍රශ්නය ද, **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න **දෙකක් ද ඇතුළු ව ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.

※ මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

**1.** පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් රසාස්වාදයක් ලියන්න.

හිස නමා ගති ඈ
සිහින් රතැඟිලි පටලවා ගති,
සතියකට පෙර ගෙනා වර
විළිබරය මගෙ රන්වන් මනාලිය.

දැල් තිර අස්සෙන්
පෙනෙයි ඈ
ඔබ යනු මොබ එනු
පට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන.

ඇසෙයි නොපෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ

මා වෙත එතත් ඈ
වුවමනාවක් කිසිත් නැතිවද
නො රැඳෙයි, පලා යෙයි.

ගෑ විලවුනෙහි,
නැත, රන්වන් සමෙහි
හෙළන සුස්මෙහි සුවඳය ඒ
ඈ බඳ සුවඳ
දැනෙන්නෙ මට විතර ද?

පෙනෙයි ඈ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන.

- මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
- අලුත ගෙනා මනාලියකගේ චර්යා නිරූපණය සඳහා කවියා යොදා ගත් සිද්ධි හා අවස්ථා
- මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය
- භාවිත පද්‍ය ආකෘතිය
- මෙම පද්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හේතු වී ඇති කරුණු (ලකුණු 06 × 5 = 30යි)

[අවසානය පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**2.** 'තුංමංහන්දිය' නවකතාවේ සිරිසේනට තම අනාගතය ගොඩනගා ගැනීම සඳහා ඔහුගේ පවුලෙන් සහ ගමෙන් ලද සහාය කෙබඳු වී දැයි නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15යි)

**3.** එදිනෙදා අත්දැකීම් සහ සිතුම් පැතුම් නිරූපණය කරමින් කාව්‍ය නිර්මාණයට පැරැන්නන් දැක් වූ සමත්කම නිර්දිෂ්ට ජනකවි ඇසුරෙන් නිදසුන් **තුනක්වත්** දක්වමින් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 15යි)

**4.** ශාසනයෙහි උකටලී වූ භික්ෂුවක් යහමගට යොමු කරවීම අරභයා බුදුන්වහන්සේ විසින් ගන්නා ලද ක්‍රියා පිළිවෙළ නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව ඇසුරෙන් නිදසුන් **තුනක්වත්** දක්වමින් පහදන්න. (ලකුණු 15යි)

**5.** 'වැලපීම කෙටිකතාව මගින් කතුවරයා සමකාලීන සමාජය තියුණු විවේචනයට ලක් කරයි.' මෙම ප්‍රකාශය නිදසුන් **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 15යි)

***

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...